

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2021

කාර්යසාධන වාර්තාව

811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

පටුන

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1	හැදින්වීම	1
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	2
1.3	ප්‍රධාන කාර්යයන්	3
1.4	සංවිධාන සටහන	8
1.5	දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා වනජීවී සංරක්ෂණ ප්‍රාදේශීය කාර්යාල	8
1.6	දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්	9
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	9

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1	සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය	10
2.1.1	ඒකාබද්ධ අරමුදල හා වනසත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය	10
2.1.2	පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ (ESCAMP)ව්‍යාපෘතියේ ප්‍රගතිය	13
2.1.3	වෙනත් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති	15
2.2	2021 වසරේ දී දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද සුවිශේෂී සේවාවන්	15
2.3	දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග	18

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	22
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	23
3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	24
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	25
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	25
3.6	වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනිමේ කාර්ය සාධනය	25
3.7	මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	26
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	26
3.9	විගණකාධිපතිගේ වාර්තාව	27

පරිච්ඡේදය 04

කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 37

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 39

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14,15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 41

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 42

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 42

6.3 මානව සම්පත් සංවර්ධනය 42

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව 44

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරය ඇතුළු දේශසීමාව තුළ වනජීවී සම්පත් දිගු කාලීනව ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මී 9100 ක් ඉක්මවයි. එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 16% ක් පමණ වේ. මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ජාතික රක්ෂිත 40 ක්ද අභයභූමි 67 ලෙස වනජීවී රක්ෂිත 107 ක් ප්‍රකාශයට පත්කර ඇත. මෙරට වනජීවී රක්ෂිත දිවයින තුළ ව්‍යාප්තව ඇති ආකාරය ඇමුණුම 1 හි දැක්වේ. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස් වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම හා අදාල නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

විවිධත්වයෙන් පොහොසත් මෙරට ජෛව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කිරීමට අමතර වශයෙන් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුල පවත්නා කෘෂි කර්මාන්තයට සහ විදුලි බල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශවල ද දිගු කාලීන ආරක්ෂාව තහවුරු කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය නිම්නයේ ජලාශ, බොහෝ මහවැලි ජලාශ, මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ, උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ, වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂි කර්මාන්තය සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි.

තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහල ජල පෝෂක ප්‍රදේශද පිහිටා ඇත්තේ ශ්‍රී පාද අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුලය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසර ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන විභවයක් වන්නේ ද වනජීවී රක්ෂිත තුල පවතින වනජීවී සම්පත් වන අතර වනජීවී රක්ෂිත ආශ්‍රිත සංචාරක කර්මාන්තය තුළින් 2021 වර්ෂය තුළ ලබා ඇති ආදායම රුපියල් මිලියන 296 පමණවේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම
වර්තමාන සහ අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම.

මෙහෙවර
සහභාගිත්ව කළමනාකරණය මගින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම.

අරමුණු:

- ජාතික හා අන්තර් ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා උපාය මාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන සහිතව රට තුල පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන් නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂවල ධරණීය ගහන පවත්වා ගෙන යාහැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.
- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්ත්වයන් යාවත්කාලීන සුපරීක්ෂාව.
- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- අදාළ රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.
- රට තුළ වනජීවී සම්පත් නීතිවිරෝධී ලෙස භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් කළමනාකරණයට අදාළ වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.
- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.
- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහල නැංවීම.
- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මගින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහල නැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ✓ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- ✓ විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- ✓ දෙපාර්තමේන්තුවේ මාසික, ත්‍රෛයිමාසික හා වාර්ෂික වාර්තා, කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.
- ✓ දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ✓ දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය හා අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- ✓ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය, නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ✓ ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම හා GIS ඒකකය කළමනාකරණය.

සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ

- ✓ රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- ✓ සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- ✓ රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ශනය කිරීම, ප්‍රකාශයට පත්කිරීම, මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම.
- ✓ වනජීවී වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ✓ ආක්‍රමණශීලී ශාක සඳහා විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ✓ ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංසටක කළමනාකරණය.
- ✓ පරිසර දූෂණය පාලනය සහ වනජීවී විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය.
- ✓ රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා හා රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම.

ස්වභාවික සම්පත් කළමනාකරණ

- ✓ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා අදාල රාජකාරී සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශ්‍ය සහාය ලබාදීම හා පනත යටතේ සිදුකළ යුතු ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකිරීම.
- ✓ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි පිළියෙල කිරීම.
- ✓ නීතිපති දෙපාර්තමේන්තුව හා නීතීය ක්‍රියාත්මක කිරීමට ආදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු.
- ✓ CITES සම්මුතිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.

නීති ක්‍රියාත්මක කිරීම්

- ✓ ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- ✓ වනඅලි පිවිසුම් ප්‍රදේශ හා පිවිසුම් ආරක්ෂාවන පරිදි වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- ✓ වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ✓ ජනාවාස තුළට වනඅලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලි වැට, ජීව වැට සහ වෙනත් නවීන ක්‍රමවේද මඟින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- ✓ වනඅලි කළමනාකරණය හා ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

අලි සංරක්ෂණ

- ✓ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හා විවිධ බාහිර පාර්ශවයන් සිදුකරන පර්යේෂණවලට අදාල උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- ✓ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමුකිරීමට කටයුතු කිරීම.
- ✓ පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.
- ✓ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයේ කටයුතු අධීක්ෂණය කර එම කටයුතු පවත්වාගෙන යාම.
- ✓ දෙපාර්තමේන්තු ප්‍රචාරක සහ මාධ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම.

පර්යේෂණ හා පුහුණු

- ✓ සංචාරක සේවා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, නව සංචාරක පැකේජ හඳුන්වාදීම හා සංචාරක කටයුතු විවිධාංගීකරණය.
- ✓ සංචාරක සේවා සහ පාරිසරික සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය.
- ✓ රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- ✓ රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායක කර ගැනීම.
- ✓ අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මගින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

සංචාරක සේවා කළමණාකරන
පාරිසරික සංචාරක හා
ජනවිභිදුම්කරණ

- ✓ වනසතුන්ගේ සෞඛ්‍ය තත්වයන් සහ රෝග තත්වයන් සම්බන්ධව සුපරීක්ෂණය සහ ක්‍රියාකාරී වීම.
- ✓ වනසතුන්ගේ පශු වෛද්‍ය ආරක්ෂණය සම්බන්ධව ඵලදායී සහ වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- ✓ වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම.
- ✓ සුභසාධනය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම සහ ගුණාත්මක බව වර්ධනය කිරීම හා වනසත්ව මිනිස් ගැටුම් කළමනාකාරිත්වයට දායකවීම.
- ✓ වන සත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ඇත්අතුරු සෙවන කළමනාකරණය කිරීම.
- ✓ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව අවශ්‍ය සහතික නිකුත් කිරීම, අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ ක්‍රියාවලියට සහාය වීම.

වනජීවී සෞඛ්‍ය කළමනාකරණ

- ✓ මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැලසුම් පිළියෙල කිරීම.
- ✓ කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවාගැනීම, උසස් කිරීම, පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.
- ✓ කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු, විනය කටයුතු,සේවා දීර්ඝ, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- ✓ නිලධාරීන්ගේ කාර්ය සාධන කටයුතු, වැටුප් වර්ධක ගෙවීම, හදිසි අනතුරු වන්දි ගෙවීම.
- ✓ ප්‍රවාහන කටයුතු අධීක්ෂණය හා ක්ෂේත්‍ර ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව.

මානව සම්පත් සංවර්ධන

- ✓ රක්ෂිත ප්‍රදේශ තුල භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ✓ රක්ෂිත ප්‍රදේශ තුල සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

ඉංජිනේරු

- ✓ දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂවල හා වනසත්ව සංරක්ෂණ අරමුදලේ ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- ✓ මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම, කලාප කාර්යාලවලට ඒවා ලබාදීම, ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම ප්‍රතිපූර්ණය, සියළුම ලැබීම් ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කිරීම හා මාසික ගිණුම් වාර්තා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම.
- ✓ වාර්ෂිකව ආදායම්, වියදම්, වනසත්ව සංරක්ෂණ අරමුදල, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහ පොදු තැන්පත් සඳහා ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- ✓ ප්‍රධාන කාර්යාලයේ සියළු ප්‍රසම්පාදන කටයුතු හා ගබඩාවේ කටයුතු අධීක්ෂණය හා පාලනය.
- ✓ විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියළුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

මුදල්

1.4. සංවිධාන සටහන (ඇමණුම 06 යටතේ බලන්න.)

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා වනජීවී සංරක්ෂණ ප්‍රාදේශීය කාර්යාල

කාර්යය මණ්ඩලය

ක්ෂේත්‍රය **1713**

1976

ප්‍රධාන කාර්යාලය **263**

වනජීවී....



වනජීවී රක්ෂිත ප්‍රදේශ

රක්ෂිත ප්‍රදේශ වර්ගය		දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව
ජාතික රක්ෂිත	දැඩි ස්වභාව රක්ෂිත	03
	ජාතික උද්‍යාන	26
	ස්වභාව රක්ෂිත	09
	වන පිවිසුම්	01
	අලි කළමනාකරණ රක්ෂිත	01
එකතුව		40
අභයභූමි		67
මූළු එකතුව		107

ප්‍රධාන කාර්යාලය

- සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
- ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය
- නීති ක්‍රියාත්මක කිරීම් අංශය
- අලි සංරක්ෂණ අංශය
- පර්යේෂණ හා පුහුණු අංශය
- සංචාරක සේවා කළමණාකරන පාරිසරික සංචාරක හා ජනවිඳුම්කරණ අංශය
- වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය
- ඉංජිනේරු අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- මුදල් අංශය

ක්ෂේත්‍රය

- කලාප කාර්යාලය - 13
- කලාප පශු වෛද්‍ය ඒකක - 08
- පශු වෛද්‍ය රෝහල් - 01
- උඩවලව ඇත් අතුරු සෙවන
- උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානය
- වනඅලි පාලන ඒකක - 04
- ජාතික උද්‍යාන මූලස්ථාන - 17
- රන්දෙනිගල පුහුණු මධ්‍යස්ථානය
- වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලය -74
- වනජීවී බීට්ටු කාර්යාලය - 85

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

වනජීවී සංරක්ෂණ අරමුදල (ව.සං.අ.)

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය ලබාගැනීමේ අරමුණින් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

1. වනසතුන්ගේ ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩි කර ගැනීම.
2. වනජීවී රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම.
3. වනජීවී සංරක්ෂණ සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
4. වනජීවී අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත්බිම් පරිසර පද්ධති කළමණාකරන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමයි.

ව්‍යාපෘතියේ නම	පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)
දායක නියෝජිතායතනය	ලෝක බැංකුව
ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු.මී.	3,600 (ඇ.ඩො. මී.35)
ව්‍යාපෘති කාලසීමාව	2017-2021

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය

2.1.1 ඒකාබද්ධ අරමුදල හා වනසත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	ඒකකය	2021 නිමැවුම්			ඉදිරි ඉලක්ක		
			ඒ.අ.	2021 අයවැය යෝජනා	ව.සං.අ.	ඒ.අ.	2022 අයවැය යෝජනා	ව.සං.අ.
වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම	ඉදිකරමින් පවතින විදුලි වැට දිග (ඇමුණුම 02-වගුව 2.7)	කි.මී.	79	-	30	-	1500	-
	විදුලි වැට නඩත්තු කටයුතු සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන්	සංඛ්‍යාව	4143	-	-	-	-	-
	දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහා ප්‍රතිපාදන නිකුත් කරන ලද ඉදිකිරීමට නියමිත හා ඉදිකරමින් පවතින මුරකුටි	සංඛ්‍යාව	-	-	93	-	385	136
	විදුලි වැට සහා දැව කණු මිලදී ගැනීම	සංඛ්‍යාව	-	7140	-	-	4738	-
	මිල දී ගන්නා ලද විදුලි වැට උපකරණ -කිමී 1500ක් සඳහා (එනජයිසර්-17ක් හා අනෙකුත් වැට උපාංග)	%	-	80	-	-	20	-
	අගල් ඉදිකිරීම	කි.මී.	-	35.5	-	-	-	-
	එල්ලෙන විදුලි වැටවල් ඉදිකිරීම	කි.මී.	-	4	-	-	15	-
	ජීව වැට ඉදිකිරීම	කි.මී	-	-	-	-	190	-
	නඩත්තු කරමින් පවතින විදුලි වැට දිග	කි.මී.	4633	-	-	-	2762	-
	මිල දී ගන්නා ලද අලි වෙඩි ප්‍රමාණය	සංඛ්‍යාව	-	-	1,296,250	-	-	-
රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම	අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන්	සංඛ්‍යාව	09	01	09	06	03	22
	අළුත්වැඩියා කරන ලද ජල සැපයුම් පද්ධති	සංඛ්‍යාව	-	01	-	-	-	-
	කඩොලාන පැල සිටුවීම - ආනවිලුන්දාව අභයභූමිය	සංඛ්‍යාව	-	-	12650	-	-	-
	ඉවත්කරනලද ආක්‍රමණශීලී ශාක බිම් ප්‍රමාණය	හෙක්ටාර්	40	254	-	350	200	308
	ඉවත්කරනලද යටිරෝපණ බිම් ප්‍රමාණය	හෙක්ටාර්	47.2	553.25	-	288	-	495
	තෘණභූමි කළමනාකරණය	හෙක්ටාර්	78	325.01	-	150	-	369
සමුද්‍ර ජීවීන් සංරක්ෂණ	සමුද්‍ර සංරක්ෂණය උදෙසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු	සංඛ්‍යාව	-	-	01	-	-	-
	අළුත්වැඩියා කරනලද බීජඝෂණ මධ්‍යස්ථාන	සංඛ්‍යාව	-	-	01	-	-	-

රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම	ස්ථාපිත කරන ලද මායිම් කණු	සංඛ්‍යාව	315	-	-	800	-	1000
	ස්ථාපිත කරන ලද විවරණ පුවරු සංඛ්‍යාව.	සංඛ්‍යාව	116	-	-	-	-	-
	සියළුම ජාතික උද්‍යාන සඳහා මායිම් කණු මිලදී ගැනීම	සංඛ්‍යාව	-	-	-	1500	-	-
	ස්ථාපිත කරන ලද හා අළුත්වැඩියා කරන ලද නාම පුවරු	සංඛ්‍යාව	35	-	-	26	-	120
	ජාතික උද්‍යාන මැණුම් කිරීම	කි.මී.	84	-	-	150	-	-
ගොඩනැගිලි ඉදි කිරීම	ඉදි කරන ලද නව කාර්යාල සහ නිල නිවාස ගොඩනැගිලි	සංඛ්‍යාව	-	-	01	-	-	-
	ඉදිකරමින් පවතින ගොඩනැගිලි.	සංඛ්‍යාව	-	-	02	-	-	-
	අළුත්වැඩියා කරන ලද පරිපාලන ගොඩනැගිලි.	සංඛ්‍යාව	-	-	27	01	-	10
	අළුත්වැඩියා කරමින් පවතින පරිපාලන ගොඩනැගිලි	සංඛ්‍යාව	-	-	-	01	-	01
	අළුත්වැඩියා කරන ලද නිල නිවාස	සංඛ්‍යාව	03	-	06	01	-	09
	ස්ථාපිත කරන ලද විදුලි සැපයුම් පද්ධති	සංඛ්‍යාව	-	-	01	-	-	-
	ස්ථාපිත කරන ලද ජල සැපයුම් පද්ධති	සංඛ්‍යාව	-	-	02	-	-	-
මාර්ග ජාලය අළුත්වැඩියාව	අළුත්වැඩියා කරන ලද මාර්ගවල දුර	කි.මී.	103	-	75	140	-	40
	අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම්	සංඛ්‍යාව	-	-	05	-	-	-
පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම	ඉදිකරන ලද නව සංචාරක බංගලා	සංඛ්‍යාව	-	-	02	-	-	02
	අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා	සංඛ්‍යාව	-	-	09	-	-	06
	විවරණ පුවරු සවිකිරීම (බුන්දල, හෝර්ටන්තැන්න, ලුණුගම්වෙහෙර)	සංඛ්‍යාව	116	-	-	-	-	-
	වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කටයුතු මගින් ලද ආදායම (ඇමුණුම 03).	රු. මී.	296	-	-	-	-	-
	ජාතික උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින් (ඇමුණුම 03).	සංඛ්‍යාව	592,817	-	-	-	-	-
රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කරන ලද කාර්යාල	සංඛ්‍යාව	02	-	01	04	-	04
	වැඩි දියුණු කරන ලද ජල සැපයුම් පද්ධති	සංඛ්‍යාව	05	-	11	02	-	02
	නල ලිං ඉදිකිරීම	සංඛ්‍යාව	-	-	-	04	-	-
	Solar Panal සවිකිරීම හා අළුත්වැඩියාව	සංඛ්‍යාව	-	-	-	02	-	03
	වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති.	සංඛ්‍යාව	01	-	03	05	-	01
වාහන අළුත්වැඩියාව	අළුත්වැඩියා කරන ලද වාහන	සංඛ්‍යාව	35	-	-	-	-	-
ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	විවිධ පුටු	සංඛ්‍යාව	31	-	-	-	-	-
	විවිධ මේස	සංඛ්‍යාව	05	-	-	-	-	-
	ඇඳුම් රැක්	සංඛ්‍යාව	05	-	-	-	-	-
	වානේ ෆයිල් කබඩ්	සංඛ්‍යාව	02	-	-	-	-	-

මිලදී ගැනීම හා අළුත් වැඩියාව	පරිගණක	සංඛ්‍යාව	61	-	-	-	-	66
	UPS	සංඛ්‍යාව	99	-	-	-	-	-
	මුද්‍රණ යන්ත්‍ර	සංඛ්‍යාව	07	-	-	-	-	06
	පුස්තකාලය සඳහා J-ISIS මෘදුකාංග මිලදී ගැනීම.	සංඛ්‍යාව	-	-	-	-	-	66
	අළුත් වැඩියා කරන ලද ගිනි අවි රඳවන	සංඛ්‍යාව	-	-	06	-	-	-
	අළුතින් සකස්කරනු ලබන ගිනිඅවි රඳවන	සංඛ්‍යාව	-	-	-	-	-	06
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	වායු සමීකරණ	සංඛ්‍යාව	-	-	-	10	-	04
	Water pumps	සංඛ්‍යාව	-	-	-	03	-	07
	ජල පෙරණ	සංඛ්‍යාව	04	-	-	05	-	01
මානව සම්පත් සංවර්ධනය කිරීම	කෙටි කාලීන පුහුණු වැඩසටහන්	සංඛ්‍යාව	07	-	14	07	-	26
	වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	සංඛ්‍යාව	48	-	-	30	-	-
	ජාතික රූපවාහිනිය මගින් විකාශය කරන සොබාධාරා වැඩ සටහන්	සංඛ්‍යාව	-	-	41	-	-	-
	වනන්තරේ කතන්දරේ ගුවන් විදුලි වැඩ සටහන්	සංඛ්‍යාව	-	-	56	-	-	08
	වනඅලි මිනිස් ගැටුම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්	සංඛ්‍යාව	-	-	113	60	-	-
	වනඅලි මිනිස් ගැටුම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන්	සංඛ්‍යාව	-	-	57	65	-	-
	දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ	සංඛ්‍යාව	13	-	-	10	-	-
	පවත්වනලද පර්යේෂණ කමිටු	සංඛ්‍යාව	03	-	-	04	-	-
ජනවිනිදුම් කරන වැඩ සටහන්	පාසැල් ළමුන් සඳහා පාසැල් බෑග් අනෙකුත් උපකරණ බෙදාදීම.	සංඛ්‍යාව	-	-	06	-	-	17
	පාසැල් ගොඩනැගිලි අළුත්වැඩියාව	සංඛ්‍යාව	-	-	02	-	-	
	ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම ව්‍යාපෘති	සංඛ්‍යාව	-	-	17	-	-	63
	ග්‍රාමීය ජනතාවගේ සුබ සාදනය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්	සංඛ්‍යාව	-	-	15	-	-	39
වනජීවී සංරක්ෂණය සඳහා නීතිය	වනජීවී අපරාධ වලට එරෙහිව ගන්නා ලද අධිකරණ ක්‍රියා මාර්ග	සංඛ්‍යාව	-	-	813	-	-	-
	ස්ථාපිත කරන ලද ගිනිඅවි රඳවන	සංඛ්‍යාව	-	-	06	-	-	-
අනෙකුත් වනජීවී සංරක්ෂණ කටයුතු.	වනසතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා Compressed CO2 powered Capture Guns Accessories මිලට ගැනීම	%	-	-	30	-	-	100
	සත්ව කූඩු සකස් කිරීම	සංඛ්‍යාව	-	-	14	-	-	65

2.1.2 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ (ESCAM)ව්‍යාපෘතියේ ප්‍රගතිය

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	ඒකකය	2021 නිමැවුම්	2022 ඉලක්ක
සංරචක 2a – වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම.	**බුන්දල ජාතික උද්‍යානයේ** කෝනවලාන ජල ව්‍යාපෘතිය, ළමා උද්‍යානය,නැදිගන්විල ප්‍රජාමූල සංවිධානයට බුලේ කට්ටලයක් ලබාදීම	සංඛ්‍යාව	03	-
	යාල ජාතික උද්‍යානයේ රණකෙළියගම හා විහාරමහාදේවිපුර කෝමාරිකා වගාකිරීම	සංඛ්‍යාව	02	-
	උඩවලව ජාතික උද්‍යානයේ හඳගිරිගොඩ ග්‍රාමයේ පානීය ජල ව්‍යාපෘතිය,මීමැසි පෙට්ටි හා කුරුඳු පැල බෙදාදීම,කුමාරපුර ජලනල මාර්ගය ඉදිකිරීම,වැව් 02 අලුත්වැඩියාව, ගම්මිරිස් පැල ලබාදීම,රතඔලාගම විසිර ජල ව්‍යාපෘතිය,ගම්මිරිස් පැල ලබාදීම	සංඛ්‍යාව	07	02
	ගල්ඔය ජාතික උද්‍යානයේ රතුගල ආදිවාසී ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ගෙවතු වගාව සඳහා පැල හා බීජ ලබාදීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	සංඛ්‍යාව	03	01
සංරචක 2b - අලි-මිනිස් යහපැවත්ම තුලින් වනඅලි හානි අවම කිරීම.	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ විදුලිවැට ඉදිකිරීම් මාර්ගයේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම.	හෙක්.	30.5	-
	වනඅලින්ට GPS කරපටි පැළඳවීම	සංඛ්‍යාව	37	03
	වනජීවී කලාප කාර්යාල සඳහා පරිගණක මිලදීගැනිම	සංඛ්‍යාව	55	-
	පරිගණක මුද්‍රණ යන්ත්‍ර	සංඛ්‍යාව	14	-
	ප්‍රධාන කාර්යාලය සඳහා Plotter machine මිලදීගැනිම.	සංඛ්‍යාව	01	-
	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ සපත්තු පාලම් ඉදිකිරීම(කි.මී.40 ක් අභ්‍යන්තර මාර්ග පද්ධතියට අදාලව).	සංඛ්‍යාව	47	-
	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ වැව් අලුත් වැඩියාව.	සංඛ්‍යාව	05	-
	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ ජල ප්‍රභවයන් අලුත් වැඩියාව	සංඛ්‍යාව	12	-
	බීට්ටු කාර්යාල හා වනඅලි පාලන ඒකක සඳහා යතුරුපැදි මිලට ගැනීම	සංඛ්‍යාව	50	-
	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම් සඳහා විදුලි වැට උපකරණ මිලදී ගැනීම	සංඛ්‍යාව	17	-

සංරචක 3a-වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමණාකරනය.	අලුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන් (උඩවලව)	සංඛ්‍යාව	12	-
	අලුත්වැඩියා කරන ලද වැව් (උඩවලව)	සංඛ්‍යාව	04	-
	යාල ජාතික උද්‍යානයේ මැණික් ගඟේ සිට පලටුපාන දක්වා ජලනල එලීම.	%	50	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති.
	වනජීවී රෝහල ඉදිකිරීම(අම්පාර)	%	50	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති
	ඉවත්කරන ලද ආක්‍රමණශීලී ශාක බිම් ප්‍රමාණය(උඩවලව, ලුණුගම්වෙහෙර, බුන්දල)	හෙක්ටාර්	1080	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති
	යාල ජාතික උද්‍යානයේ ජල ප්‍රභවයන් අලුත්වැඩියාව	සංඛ්‍යාව	12	-
	යාල ජාතික උද්‍යානයේ ගල් කෙම් අලුත්වැඩියාව	සංඛ්‍යාව	03	-
	උඩවලව,ලුණුගම්වෙහෙර,යාල ජාතික උද්‍යානවල තණකොල කපන මැෂින් මිලට ගැනීම.	සංඛ්‍යාව	35	-
	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ වැව් අලුත්වැඩියාව.	සංඛ්‍යාව	03	-
	ගල්ඔය ජාතික උද්‍යානයේ බීට්ටු කාර්යාල අලුත්වැඩියාව.	සංඛ්‍යාව	01	-
	නිල නිවාස අලුත්වැඩියාව(යාල ජාතික උද්‍යානය)	සංඛ්‍යාව	91	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති
සංරචක 3b - වනජීවී රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම.	යාල ජාතික උද්‍යානයේ පටනංගල සංචාරක විවේකාගාරය,වාහන නැවතුම් අංගනය,වැසිකිලි පහසුකම් හා භූමි අලංකරණය.	%	30	70 ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති
සංරචක 3c—වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතන ධාරිතාව සහ අයෝජන හැකියාව වර්ධනය කිරීම.	යාල ජාතික උද්‍යානය සඳහා Road Traffic Guns මිලදී ගැනීම.	සංඛ්‍යාව	02	-
	ක්ෂේත්‍ර කාර්යාල සඳහා වතුර ෆිල්ටර් මිලදී ගැනීම	සංඛ්‍යාව	80	-
	ක්ෂේත්‍ර කාර්යාල සඳහා වතුර ටැංකි මිලදී ගැනීම	සංඛ්‍යාව	30	-
	වනජීවී නිලධාරීන් සඳහා පළමු හා දෙවන වනජීවී ඩිප්ලෝමා පාඨමාලාව	නිලධාරීන්	57	-
	වනඅලින් 700 කගේ Dung සාම්පල් මගින් ජාන විවිධත්වය සොයාබැලීම.	සංඛ්‍යාව	700	-
	ගිරිතලේ වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ කාර්යාලය හා දේශන ශාලාව අලුත්වැඩියාව	%	40	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති
	ගිරිතලේ වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ පැරණි නේවාසික ගොඩනැගිල්ල අලුත් වැඩියාව	%	20	ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවති

2.1.3 වෙනත් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

මොරගහකන්ද - කළු ගඟ ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

කළු ගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත්කිරීම හා එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම මෙහි අරමුණ වන අතර ඒ යටතේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්වේ.

- ඉහත ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා බාධක පිහිටුවීම.
- වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාපෘතියට යටත්වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	ඒකකය	2021 නිමැවුම්
වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම	**වස්ගමුව/සෝමාවතිය ජාතික උද්‍යානය**		
	උද්‍යාන පිවිසුම්	සංඛ්‍යාව	01
	නිල නිවාස අළුත්වැඩියාව	සංඛ්‍යාව	03
වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	**මින්නේරිය ජාතික උද්‍යානය**		
	මාර්ග සංවර්ධනය කි.මී.13	%	50
	විවරණ මධ්‍යස්ථානය අළුත්වැඩියාව	%	80
	වස්ගමුව ජාතික උද්‍යානය		
	පානීය ජල පහසුකම් සැපයීම (කාර්යාල සඳහා)	සංඛ්‍යාව	01

2.2 2021 වසරේ දී දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සුවිශේෂී සේවාවන්

- 2021 පෙබරවාරි මස 02 වන දිනට යෙදුන ලෝක තෙත්බිම් දිනය "තෙත් බිම් සහ ජලය''යන තේමාව යටතේ පවත්වන ලදී.
- වනජීවී රක්ෂිත ජාලය තුල වන අපරාධ මැඩපැවත්වීම සඳහා වැටලීම් 813 ක් සිදුකර වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කර රු.මි 56 ක දඩ මුදල් අයකරගෙන ඇත.
- 2021 වර්ෂයේදී වනජීවී සංරක්ෂණ අරමුදලට බැර කරන ලද උසාවි දඩමුදල් ප්‍රමාණයෙන් වරදේ ස්වභාවය අනුව එම වැටලීම්වලට දායකවූ නිලධාරින්ට රු.මි. 13.96 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා ඇත.
- 2021 වසරේ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පහත සඳහන් ලෙස අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත.

අලිවෙඩි වර්ගය	ප්‍රමාණය	වියදම (රු.මි.)
ගිගුම්(ලොකු)	235,000	28.66
ගිගුම්(පොඩි)	770,000	78.42
සංඥා දහර	291,250	42.87
එකතුව	**1,296,250**	**149.95**

- වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් සකස් කිරීම පිළිබඳ විද්වත් කථිකාව 2021.03.24 දින SLIDA ආයතනයේදී පවත්වන ලදී.

- වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පර්යේෂණ අත්හදා බැලීම් යටතේ වනඅලි ගම්වැදීම වැළැක්වීම සඳහා හදුන්කුරු දැල්වීම සහ ජීව වැටක් සඳහා හණපැල 3000ක් සිටුවීම සිදුකර ඇත.

- 2021 වර්ෂයේ අලි මිනිස් මරණවල වර්ගීකරණය, දේපල හානි හා ශාරීරික හානි සිදුවීම්වල ව්‍යාප්තිය, විදුලි වැට ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ඇමුණුම 02 මගින් දක්වා ඇත.

- දිවයින පුරා වනඅලි පහරදීම් හේතුවෙන් පීඩාවන්ට පත් වූ ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වනඅලි හානි සඳහා වන්දි ගෙවීම සිදුකරන අතර 2021 වසරේ දෙසැම්බර් 31 වන විට ගෙවන ලද වන්දි ප්‍රමාණයන් පහත පරිදී වේ.

වන්දි වර්ගය	**2021.12.31** දිනට වාර්තාවී ඇති සිදුවීම් සංඛ්‍යාව	**2021.12.31** දිනට වාර්තාවී ඇති ගෙවීම්(රු.මි.)
ජීවිත හානි	142	33.20
ශාරීරික හානි	58	1.22
දේපල හානි	1326	40.36
එකතුව	**1526**	**74.78**

(ඉහත වන්දි මුදල් තුල 2021 වසරේ සිදුවූ හානිවලට අමතරව 2021 වසරට පෙර වසරවල සිදු වූ එහෙත් 2021 වසරේදී ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා ගෙවිමිද අතුලත් වේ.)

- Wildlanka අන්තර් ජාතික පර්යේෂණ සඟරාව දැනට වසරකට වෙළුම් 04 කින් යුතුව ප්‍රකාශයට පත් කරන අතර 2021 වර්ෂයේ දී ගුණාත්මකභාවයෙන් ඉහළ දෙස් විදෙස් පර්යේෂණ වාර්තා රාශියක් ප්‍රකාශයට පත්කර ඇත. මෙම වර්ෂයේ දී එහි පිටු සංඛ්‍යාව 200 දක්වා වැඩි කර ඇත. එහි කතෘ මණ්ඩලය පිළිගත් දෙස් විදෙස් විශ්ව විද්‍යාල ඇදුරු මණ්ඩලයකින් සහ ප්‍රවීණ විද්‍යාඥයන්ගෙන් සමන්විතයි. මෙය දෙපාර්තමේන්තුව අන්තර්ජාතික පිළිගැනීමකට ලක්වීමට මහත් පිටුවහලක් විය.

- දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කරන ලද ශ්‍රී ලකාවේ වනඅලින්ගේ DNA විශ්ලේෂණය පිළිබඳ පර්යේෂණ වාර්තාව අන්තර්ජාතික පිළිගැනීමකට ලක්ව ඇති පර්යේෂණ සඟරාවන් මගින් ප්‍රකාශයට පත්කර ඇත.

- ශ්‍රී ලාංකිකයෙකු විසින් ප්‍රථමවරට සොයාගන්නා ලද නෙලු විශේෂයක් වන "Strobilanthes Madahinnensis Nilanthi" දෙපාර්තමේන්තු නිලධාරිනියක විසින් සොයාගන්නා ලද අතර අන්තර්ජාතික පිළිගැනීමකට ලක්ව ඇති පර්යේෂණ සඟරාවන් මගින් ප්‍රකාශයට පත්කර ඇත.

- දෙපාර්තමේන්තුව විසින් *Crudia Zeylanika* ශාකය පිළිබඳව දීර්ගව අධ්‍යයනය කර සකසන ලද පර්යේෂණ වාර්තාව අන්තර්ජාතික පිළිගැනීමකට ලක්ව ඇති පර්යේෂණ සඟරාවක ප්‍රකාශයට පත්කිරීම සඳහා භාරදී ඇත.

- කළු කොටියාගේ DNA විශ්ලේෂණය සාර්ථකව අවසන්කර ඇති අතර ඒ පිළිබඳව පර්යේෂණ වාර්තාව සකසමින් පවතී.

- වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුම, කාලීන සිදුවීම්, වාර්තාමය වැඩසටහන් පිළිබඳව විද්‍යානුකූලව කරුණු ලෝකයට ලබාදීම අරමුණු කර ගනිමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් "Blue Green Media" නමින් YouTube චැනලයක් ආරම්භ කරන ලදී. මෙහි මුල්ම වැඩ සටහන 2021 ලෝක වනජීවී දිනය නිමිත්තිකරගෙන පවත්වන්නට යෙදුනු විද්වත් සාකච්ජාවෙන් ආරම්භ කෙරුණු අතර සාර්ථකව වැඩ සටහන් 08 ක් නිමා කිරීමට හැකිවිය. එම වැඩ සටහන් සඳහා ආරාධනා කරනු ලැබූ විද්වත් සම්පත් දායකයින්ගේ කැපවීම මෙම වැඩසටහනේ සාර්ථකත්වය වඩාත් ඉහළ නැංවීමට පිටිවහලක් විය. මෙම වැඩසටහන හා සම්බන්ධ වන වනජීවී ලෝලින් සංඛ්‍යාව ඉහල යාමත් සමගම එම චැනලය තවත් චැනල 04 ක් සම්බන්ධ කිරීම මගින් පුළුල් විය.

  - ✓ **නීල හරිත උරුමය**

    වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතින් ආරක්ෂිත ශාක හා සතුන්ගේ හෙට දවස වෙනුවෙන් ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් ඒවා පිළිබඳව කෙටි හැඳින්වීමක්, වාසස්ථාන, සංරක්ෂණ තත්ත්වය, නීතිමය තත්ත්වය, තර්ජන හා සංරක්ෂණය පිළිබඳව කෙටි වීඩියෝ පට ඇතුලත් කිරීමට බලාපොරොත්තු වේ.

  - ✓ **හරිත අරුත**

    වනජීවී සංරක්ෂණය උදෙසා විවිධ පැතිකඩයන් ඔස්සේ විද්වත් කථිකාවන් ඇතුලත් කිරීමට බලාපොරොත්තු වේ. දෙපාර්තමේන්තුවට බලපාන තර්ජන හා ඒවා නිරාකරණය කරගැනීමට අවශ්‍ය ආකාරයට මෙම කථිකාවන් සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ.

  - ✓ **කාලීන සම්බන්ධතා**

    දෙපාර්තමේන්තුවේ කාලීන සිදුවීම් හා අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති දිනයන් අළලා සංවිධානය කරනු ලබන විද්වත් කථිකාවන් ඇතුලත් කිරීමට බලාපොරොත්තුවේ.

✓ **වාර්තාමය වැඩසටහන්**

දෙපාර්තමේන්තුවේ රක්ෂිත ප්‍රදේශ ජාලය අලලා එහි ඇති පාරිසරික වටිනාකම සහ ස්වභාව සුන්දරත්වයක් අළලා, පර්යේෂකයින්, විශ්ව විද්‍යාල සිසුන් , වනජීවී ලෝලින් අරමුණු කර ගනිමින් සකසන ලද වාර්තාමය වැඩසටහන් ඇතුලත් කිරීමට නියමිතය.

- **ශ්‍රී ලංකාවේ ඊ-සයිටිස් (e-CITES) ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම**.

✓ ශ්‍රී ලංකාවේ ඊ-සයිටිස් (e-CITES) ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් CITES සහ FFPO බලපත්‍ර අයදුම් කිරීම, නිකුත් කිරීම සහ පාලනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීමට කටයුතු කර ඇත. රාජ්‍යයන් අතර සිදු කෙරෙන තර්ජනයට ලක්වූ ශාක සත්ව විශේෂ සම්බන්ධ වෙළඳාම කාර්යක්ෂම කිරීම සහ ශාක හා සත්ව විශේෂ වල නීති විරෝධී වෙළඳාම පාලනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙම e-CITES ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රමය මගින් අනාගතයේදී, දැනට ශ්‍රී ලංකා රේගුව විසින් භාවිතා කරනු ලබන ASYCUDA පද්ධතිය සමඟ අන්තර් ක්‍රියාකාරිත්වයක් සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමටද බලාපොරොත්තු වේ.

2.3 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග

	ඉදිරි ඉලක්ක		අභියෝග
1	**වනසත්ව - මිනිස් ගැටුම් අවම කිරීම**	**1.** පවතින විදුලි වැට කි.මී. 4,633 නඩත්තු කර පවත්වාගෙන යාම. **2.** නව විදුලි වැට කි.මී. 1,500ක් ඉදි කිරීම. **3.** වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පර්යේෂණ අත්හදා බැලීම් සිදුකිරීම	✓ විශාල භෞතික හා මානව සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවීම. ✓ විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම. ✓ ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ දී මුහුණ දීමට සිදුවන ගැටළු. ✓ විදුලි වැට කණු මිලදී ගැනීමට පවතින එකම ආයතනය රාජ්‍ය දැව සංස්ථාව වන බැවින් එහි පවතින ධාරිතාවය අනුව ඇතිවන ප්‍රමාදයන්. ✓ විදුලි වැට උපකරණ ආනයනය කිරීමේදී අදාල ආයතනවලින් සිදුවන ප්‍රමාදයන්. ✓ උද්‍යානය තුල පවතින මාර්ග පද්ධතියේ පවතින අඩුපාඩු නිසා සිදුවන ප්‍රවාහන අපහසුතා.
2	**රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය**	**1**.රක්ෂිත ප්‍රදේශවල හෙ.2,200 ක් වාසස්ථාන සුපෝෂණය සිදු කිරීම. **2**.ජල ප්‍රභවයන් 31 ක් අලුත්වැඩියා කිරීම.	✓ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලඟාවීම. ✓ රක්ෂිත ප්‍රදේශ තුල සංවර්ධන කටයුතු සිදු කිරීමේදී පවතින දුර හා නවාතැන් ගැනීමට අපහසුවීම හේතුවෙන් ඉටුකරන වැඩ කොටස සීමිතවීම.

3	**වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණුව.**	**1.**පීඩාවට පත්වන වනසතුන්ට ප්‍රතිකාර කිරීමට වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම.	✓ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අපේක්ෂිත ගුණාත්මක භාවයෙන් හා තත්වයෙන් උසස් නියමිත් ප්‍රමිතියට අනුකූල උපකරණ හා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමේ අපහසුතාවය. ✓ ක්ෂේත්‍ර කාර්යාලවල සංවර්ධන කටයුතු සිදුකිරීමේදී සංචාරක ක්ෂේත්‍රයට ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවීම. ✓ ස්ථානමාරු ප්‍රතිපත්තිය අනුව පුහුණු නිලධාරින් වෙනත් ස්ථානවලට මාරුවී යාම, නවක නිලධාරින් පුහුණුවට කල්ගතවීම හා පුහුණු නිලධාරින් හිඟතාවය.
4	**වනජීවී රක්ෂිත ප්‍රදේශ රැක ගැනීම සහ නව රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.**	**1.** හඳුනාගත් නව රක්ෂිත ප්‍රදේශ 20ක් ප්‍රකාශයට පත් කිරීම. **2.** කි.මී.150ක රක්ෂිත ප්‍රදේශ මිනුම් කර මායිම් ගල් යෙදීම. **3.** .මායිම් කණු 1800 ක් ස්ථාපිත කිරීම.	✓ රාජ්‍ය හා පෞද්ගලික සංවර්ධන ව්‍යාපෘති සඳහා රක්ෂිතවල ඉඩම් යොදා ගැනීම සඳහා සිදුකරනු ලබන ඉල්ලීම්. ✓ රක්ෂිත ප්‍රදේශ සඳහා හඳුනාගත් ඉඩම් සඳහා වෙනත් ආයතනවල එකඟතාවයන් ගැලපීම හා ප්‍රමාදයන් ඇතිවීම. ✓ මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් සමග කටයුතු කිරීමේදී ඔවුන්ගේ සැලසුම් හා කාල රාමුවට අනුව කටයුතු කළයුතුවීම. ✓ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලඟාවීම.
5	**වනජීවී අපරාධ මැඩලීම සඳහා යාන්ත්‍රණය ශක්තිමත් කර පවත්වා ගෙන යාම**	**1.** වනජීවී අපරාධ මැඩලීම සඳහා SMART මුර සංචාර ක්‍රමය දිවයින පුරා ව්‍යාප්ත කිරීම. **2.** GPS සහ GIS වැනි නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය වැඩිදියුණු කිරීම. **3.** වනසත්ත්ව වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ උසාවි කාර්ය පටිපාටිය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම. **4.** වනජීවී අපරාධ මැඩලීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනත සංශෝධනය කිරීම හා නව නීති ඇතුලත් කිරීම. **5.** වනජීවී අපරාධ මැඩලීම සඳහා තොරතුරු ලබාගැනීමට බුද්ධිමය ඒකකයක් ස්ථාපිත කිරීම.	✓ ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් බහුල පුහුණු නිලධාරින් ප්‍රමාණවත් නොවීම. ✓ නිලධාරින් කණ්ඩායම් වශයෙන් කලාප මට්ටමින් එකවර යොදැගැනීමේ අපහසුව නිසා පුහුනුව අවසන්වනතුරු නිලධාරින්ගේ දැනුම ප්‍රායෝගිකව යොදාගැනීමේ අපහසුතාවය. ✓ උසාවි කාර්ය පටිපාටිය සම්බන්ධ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීමට සුදුසු ක්‍රමවේදයක් නොතිබීම. ✓ අණ පනත් සංශෝධනයේදී ආයතන අතර සම්බන්ධීකරණය අනුව කටයුතු ප්‍රමාදවීම. ✓ බුද්ධිමය ඒකකය ස්ථාපිත කිරීමේදී සුදුසු නිලධාරින් තෝරා ගැනීම හා එම කණ්ඩායමක රාජ්‍ය බුද්ධි ඒකකය හරහා පුහුණු කරවා ගැනීම.

6	**රක්ෂිත ප්‍රදේශ අවට ජනතාව සංරක්ෂණ යට දායක කර ගැනීම**	**1.** ග්‍රාමීය ජනතාවගේ වනජීවී සංරක්ෂණය උදෙසා ආකල්ප වර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. **2.** ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	-
7	**පාරිසරික සංචාරක කර්මාන්ත ය වැඩි දියුණු කිරීම**	**1.** ජාතික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (මාර්ග පද්ධතිය / සනීපාරක්ෂක පහසුකම් / සංචාරක නිවාසවල තත්ත්වය). **2.** සංචාරකයින් සඳහා නව ඊ-සේවාවන් ප්‍රවර්ධනය කිරීම (e-ticketing/ e-booking). **3.** ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සහ ජීප් රථ රියදුරන්ගේ සේවයේ ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අරමුණින් වැඩමුළු පැවැත්වීම. **4.** සංචාරක බෝට්ටු රියදුරන් හා සෆාරි ජීප්රථ රියදුරන් සඳහා හැඳුනුම්පත් ලබාදී සේවාව ක්‍රමවත් කිරීම.	✓ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී සැලසුම් කල කාලසීමාව තුල අදාල නීති රීති රාමුව තුල ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්. ✓ සංචාරකයින් වැඩිපුර පැමිණෙන කාලසීමාව තුල සංචාරකයින්ගේ උපරිම ධාරිතාවයට අනුගතවන පරිදි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අපහසුතා. ✓ තාක්ෂණ කටයුතුවලදී මුහුණ දීමට සිදුවන අපහසුතාවයන්. ✓ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලහාවීම.
8	**දෙපාර්ත මේන්තුවේ මානව සම්පත් සංවර්ධනය**	**1.** වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිලධාරීන් බඳවාගැනීම සහ පුහුණු කිරීම. **2.** ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු ආයතනය අන්තර්ජාතික පුහුණු ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම. **3.** රන්දෙණිගල Tree Center පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය. **4.** දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීමේ හැකියා වර්ධනය කිරීම.	-

9	**අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මක කිරීම**	**1.** CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව ප්‍රවලිත කිරීම. **2.** CITES RAMSAR අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම.	✓ e-CITIES බලපත්‍ර නිකුත් කිරීමේ ඉලෙක්ට්‍රොනික පද්ධතියට ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් විද්‍යාත්මක ආයතන ක්‍රියාකාරීව සම්බන්ධ කරගැනීම.
10	**ස්වභාවික අපදාවන් ගෙන් වනජීවින්ට සිදුවන හානි අවම කිරීම.**	**1.** ගිනි ගැනීම් සහ පැතිරීම අවම කිරීමට වනජීවී රක්ෂිත තුල ගිනි පටි ඉදිකිරීම. **2.** නියං සමයේ ජල අවශ්‍යතාවයන් සඳහා රක්ෂිත තුල කෘතීම වතුර වලවල් ඉදිකිරීම සහ පවතින ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම.	✓ අනපේක්ෂිත කාලගුණික තත්වයන් ✓ කොන්ත්‍රාත්කරුවන් වැඩ අවසන් කිරීමේදී සිදුවන ප්‍රමාදයන්.
11	**නව පර්යේෂණ ප්‍රවණතා**	**1.** කලු කොටියාගේ DNA විශ්ලේෂණය කිරීම මගින් කලු කොටියාගේ බිහිවීමට බලපාන හේතු සාධක විමසා බැලීම තුලින් ඔවුන් සංරක්ෂණයට පියවර ගැනීම. **2.** "WildLanka Symposium" නව මුහුණුවරක් යටතේ වවුනියාව හා යාපනය වැනි විශ්ව විද්‍යාල සඳහා වෙනම සැසිවාරයක් පැවැත්වීම. **3.** වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුම, කාලීන සිදුවීම්, වාර්තාමය වැඩ සටහන් පිළිබඳව විද්‍යානුකූලව කරුණු ලෝකයට ලබාදීම අරමුණු කර ගනිමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් "Blue Green Media" නමින් Utube වැනලයක් ආරම්භ කිරීම. එය අනු කොටස් 04 ක් යටතේ වැඩි දුරටත් පුළුල් කිරීම. • Current Affaires Series • Blue Green heritage • Haritha Arutha Program • Documentation	

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
17,000,000	ආදායම් ලැබීම්		**17,417,277**	**18,813,594**	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
17,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	17,417,277	18,813,594	
17,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		17,417,277	18,813,594	
3,807,755,293	ආදායම් නොවන ලැබීම්		**3,812,134,538**	**3,287,239,248**	
3,188,130,000	භාණ්ඩාගාර අග්‍රිම		3,188,130,000	2,171,890,000	ඒසීඒ-3
126,457,181	තැන්පතු		126,457,181	120,248,750	ඒසීඒ-4
48,000,000	අත්තිකාරම් ගිණුම්		52,379,245	36,205,110	ඒසීඒ-5
445,168,112	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		445,168,112	958,895,389	
3,807,755,293	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**3,812,134,538**	**3,287,239,248**	
3,824,755,293	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**3,829,551,815**	**3,306,052,842**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
3,824,755,293	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		3,829,551,815	3,306,052,842	
	අඩු කළා : වියදම්				
1,773,300,000	පුනරාවර්තන වියදම්		**1,768,788,750**	**1,581,182,021**	
1,173,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,171,925,632	1,123,422,267	
205,170,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	202,200,348	163,525,725	ඒසීඒ-2(ii)
116,630,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	116,572,724	101,612,249	
0	පොළී ගෙවීම්	8	-	0	
278,300,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	278,090,046	192,621,779	
1,773,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**1,768,788,750**	**1,581,182,021**	
2,754,500,000	මූලධන වියදම්		**962,299,976**		
36,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	23,856,330	17,061,346	
25,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	16,831,105	20,688,853	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	0	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	0	
25,000,000	හැකියා වර්ධනය	14	7,272,830	7,618,982	
2,668,500,000	වෙනත් මූලධන වියදම්	15	914,339,711	104,880,237	
2,754,500,000	මුළු මූලධන වියදම් (උ)		**962,299,976**	**150,249,418**	
107,701,777	තැන්පතු ගෙවීම්		107,701,777	218,329,373	ඒසීඒ-4
1,356,488,482	වනසත්ව සංරක්ෂණ අරමුදලේ ගෙවීම්		1,356,488,482	1,557,408,536	
69,000,000	අත්තිකාරම් ගෙවීම්		73,304,518	55,104,615	ඒසීඒ-5
(11,288,826)	වැට් ගෙවීම්		(11,288,826)	3,778,361	
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
1,521,901,433	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,526,205,951	1,834,620,885	
6,049,701,433	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		4,257,294,677	3,566,052,324	
(2,224,946,140)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(427,742,862)	(259,999,482)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(427,742,862)	(259,999,482)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	1	-	-	ඒසීඒ-3

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	32,319,393,960	31,587,353,755
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	247,580,199	228,738,661
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**32,566,974,159**	**31,816,092,416**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		77,881,513	77,795,379
දේපළ පිරියත හා උපකරණ සංචිතය		32,319,393,960	31,587,353,755
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	169,698,686	150,943,282
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**32,566,974,159**	**31,816,092,416**

පිටු අංක 7 සිට 49 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 91 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
මේජර් ජනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
දිනය : 2022.02. 2

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු
ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
අංක 416 ඩී 1, 5 වන මහල, "සොබාදම් පියස"
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල

ගණන්දීමේ නිලධාරි
එම්.ජී.ඩී. සූරියබණ්ඩාර
වනජීවී අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය : 2022.02.

එම්. ජී. ඩී. සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක. 811/ඒ. ජයන්තිපුර පාර.
බත්තරමුල්ල

අධ්‍යක්ෂ (මුදල්)
වාමිනී ජයසිංහ
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය : 2022.02.17
වාමිනී ජයසිංහ
අධ්‍යක්ෂ (මුදල්)
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක. 811/ඒ, ජයන්තිපුර පාර.
බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2021	නැවත ගලපන ලද 2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	16,990,756	18,450,921
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	77,714,535	107,291,117
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	3,188,130,000	2,171,890,000
අන්තිකාරම් අයකර ගැනීම්	56,952,020	39,463,553
තැන්පතු ලැබීම්	126,457,181	120,248,750
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,466,244,492	2,457,344,341
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	1,373,980,549	1,286,728,503
සහනාධාර සහ මාරුකිරීම්	18,714,638	41,367,997
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,733,305	5,895,117
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අන්තිකාරම් ගෙවීම්	73,332,573	55,519,905
තැන්පතු ගෙවීම්	107,701,777	218,329,373
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,577,462,842	1,607,840,895
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	1,888,781,650	849,503,446
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	911,035,570	139,910,821
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	911,035,570	139,910,821
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(911,035,570)	(139,910,821)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	977,746,080	709,592,625
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
වනසත්ව සංරක්ෂණ අරමුදල	367,453,577	851,604,272
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	367,453,577	851,604,272
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
ශුද්ධ වැටි ගෙවීම්	(11,288,825)	3,778,361
වනසත්ව සංරක්ෂණ අරමුල	1,356,488,482	1,557,408,536
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	1,345,199,657	1,561,186,897
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	(977,746,080)	(709,582,625)
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	10,000
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාල නොවේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරනලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
6000-0-0-6-20	වනසත්ව සංරක්ෂණ අරමුදල	1,348,560	343,999	339,894	98.9
2003-02-06	බංගලා ගාස්තු	17,000	17,000	17,417	102

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ඒකාබද්ධ අරමුදල **රු.,000**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්ථන	1,773,300	1,773,300	1,768,790	100
2021 අයවැය යෝජනා	2,370,000	2,370,000	842,170	36
ප්‍රාග්ධන	384,500	384,500	120,130	31

වනසත්ව සංරක්ෂණ අරමුදල **රු.,000**

වියදම් ඛාණ්ඩය	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන	සත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන,අවසන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
පුනරාවර්ථන	959,610	959,610	948,050	**99**
ප්‍රාග්ධන	413,600	413,600	408,440	**99**

(ඇමුණුම 04)

3.7 මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු., 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් ප්‍රතිපාදනවල %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය සේවා,පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිධාරී පුහුණු දීමනාව ගෙවීම	433	433	433	100
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාමගන්නා අවස්ථාවේදී රජයට අයවියයුතු මුදල් සඳහා.	3,329	3,329	3,329	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය
6111	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	644,653
6112	යන්ත්‍රෝපකරණ	-	824,656
6141	ඉඩම්	-	30,850,084

3.9 විගණකාධිපතිගේ වාර්තාව

(182)



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ඩබ්එල්/සී/ඩීඩබ්සී/එෆ්ජ්/2021 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් නොවන ලැබීම්

(අ) අත්තිකාරම් ලැබීම්

2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලේජර් ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතුය. ඊට පැටහැනිව භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.54,462,979 ක් වුවද අත්තිකාරම් ලැබීම් ලෙස අනෙකුත් ගිවිස විසින් අත්තිකාරම් බී ගිණුමට බැර කරන ලද රු.2,083,734 ක වටිනාකම් නොසලකා රු.52,379,245 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබුණි.

(ආ) වෙනත් ලැබීම්

2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් නොකළ යුතු අතර එම ආදායම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැලපීම් කළ යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු

කරන ලද රු.77,714,535 ක් වූ ආදායම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර නිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් වක්‍ර ලේඛයෙහි සඳහන් ආකෘතිය ප්‍රකාරව තැන්පතු ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් වශයෙන් දැක්විය යුතුය. එසේ වුවද පොදු තැන්පත් ගිණුමක් වශයෙන් දක්වා තිබෙන වනඅත්ව සංරක්ෂණ අරමුදලට ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.367,453,577 ක් හා රු.1,356,488,482 ක් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

1.6.2.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

අනාගත සේවා ඉටුකිරීමේ දායකත්වය බලාපොරොත්තුවෙන් සම්පත් සඳහා කරනු ලබන මුදල් ගලායාම් ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇති වන මුදල් ප්‍රවාහයන් මඟින් නියෝජනය කරන නිසා එම මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතුය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශ අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් යටතේ දරන ලද රු.179,508,496 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එම වටිනාකම් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි.

1.6.3 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා

(අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.5 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනැති දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතුය. 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඒ අනුව දැක්විය යුතු වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුළත්කර නොතිබුණි.

(ආ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති සංඛ්‍යාව, අවසාන

භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලේජර් ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුලත් කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.39,534,166 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු.36,205,110 ක් වූයෙන් රු.3,329,056 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති සංඛ්‍යාව, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලේජර් ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ඇතුලත් කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගෙවීම් රු.55,690,601 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු.55,104,615 ක් වූයෙන් රු. 585,986 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි 2020 වර්ෂය සඳහා වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස රු.958,895,389 ක් සටහන් කර තිබුණද එවැනි ලැබීමක් විගණනයට නිරීක්ෂණය නොවිය.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වුවද විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 11 ක සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
i. XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	රජයට අය විය යුතු මුදල් අය කර ගත යුතු ආකාරය දක්වා ඇතත් මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කල නිලධාරීන් 26 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ඉක්ම වූ රු.1,127,483 ක ණය ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.
ii. XLVIII පරිච්ඡේදයේ 1.2 ඡේදය	නිලධරයන් අතින් සිදුවන්නා වූ සියලුම විෂමාචාර ක්‍රියාවන් හෝ ප්‍රමාද දෝෂයන් සම්බන්ධව හැකිතාක් ඉක්මනින් විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාළ අනෙකුත් ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියාකල යුතු වුවද විනය ක්‍රියාමාර්ග 14 ක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා කමිටු පත්කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශන අවසන් කර නොනිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571	නැන්පත් කල දින සිට වර්ෂ පහක් ඉක්ම වූ රු.5,486,600 ක් වූ පොදු නැන්පතු ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

i.	2.14.1 (අතිරේක 35)	වටිනාකම රු.මිලියන 500 ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතු වුවද 2021 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.631,067,014 ක් වූ අලිවැට උපකරණ අයිතම 30 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත් 07 කට වෙන්කර අවස්ථා 07 ක දී ලංසු කැඳවීම් 07 ක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි. මේ හේතුව නිසා මිල ගණන් කැඳවීමට පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමට හා තාක්ෂණික ඇගයීම් කමිටුවට අවස්ථා 07 කදී ගෙවීම් සිදු කිරීම හේතුවෙන් රු.557,320 ක අතිරේක වියදමක් දරා තිබුණි.
ii.	3.9.1	ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සමිති මඟින් කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමේදී ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිත සමිතියේ යෝග්‍යතාවය ඇගයිය යුතු වුවද, කොන්ත්‍රාත් කාර්යයන් 05 ක් සඳහා කොන්ත්‍රාත් කටයුතු ප්‍රදානය කිරීමේදී තෝරා ගැනීමේ කමිටුව විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පාඩු හා අත්හැරීම්

(අ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පිළියෙල කර ඇති හානි පාඩු ලේඛනයෙහි සඳහන් රු.14,355,383 ක අලාභ හානි මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවීමට කටයුතු කළ යුතු වුවද වාහන අනතුරු 10 ක් සම්බන්ධව අනතුර සිදු වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද වාහන අනතුරු 17 ක් සම්බන්ධව අනතුර සිදු වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

3.2 කාර්යය භාර්යන් ඉටු නොකිරීම.

2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්කගත කාර්යයන් 11 ක් සඳහා රු.17,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් එම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

2021 වර්ෂයේ වනජීවී කලාප 09 ක විදුලි වැට ඉදි කිරීම සඳහා මාර්ග එළිපෙහෙලි කිරීම හා විදුලි වැට ඉදිකිරීම සඳහා රු.29,322,490 ක් ඇස්තමේන්තුගත කර තිබුණද එහි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

3.4 වන්කම් කළමනාකරණය.

විදේශාධාර ව්‍යාපෘති වලින් ලැබෙන වන්කම් වාර්තා ගත නොවීමේ අවදානම 2020 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මගින් පෙන්වා දී තිබුණද 2022 පෙබරවාරි 19 දින විගණනය විසින් GIZ ව්‍යාපෘතියෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් උපකරණ හා වන්කම් සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂා කිරීම අනුව රු.20,755,328 ක් වටිනා වන්කම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාවෙහි GIZ වටිටෝරු පොත්වල වාර්තා කර නොතිබුණි. අදාළ උපකරණ ආයතනය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට විධිමත්ව භාරදී තිබුණද එම

දත්ත ගිණුම් අංශය හා ප්‍රධාන ගබඩාව වෙත වාර්තා නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල. දක්වා නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර 1285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ගැසට් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2020 සහ 2021 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තුව සඳහා දරන ලද වියදම් පිළිවෙලින් රු.257,521,334 සහ රු.714,695,969 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම් අවම්වීමක් නිරීක්ෂණය නොවිය.

(ඇ) උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් එලීම සඳහා 2021 මාර්තු 15 දින රෙඩෙකෝ ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව දින 90 ක් ඇතුලත එනම් 2021 ජුනි 15 වන විට කාර්ය නිම කළ යුතු වුවද 2022 මාර්තු වන විටත් ගිවිසුම්ගත වටිනාකම රු.18,446,000 ක් වූ වනඅලි සංචරණ බාධක තැටි 4,010 ක් සපයා නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේ කිලෝ මීටර් 1,500 දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍යවන පෙරසවි බල ශක්ති කුටි 194 ක්, පෙරසවි වැසිකිළි 385 ක් හා කොන්ක්‍රීට් කියුබ් 3,080 ක් මිලදී ගැනීම් වෙනුවෙන් රෙඩෙකෝ ආයතනය සමඟ 2021 මාර්තු 15 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 90 ක් ඇතුළත එනම් 2021 ජුනි 15 දින අවසන් වීමට පෙර සැපයීම් සිදු කළ යුතු වුවද 2022 මාර්තු වන විටත් ගිවිසුම් ගත වටිනාකම රු.46,683,426 ක් වූ පෙරසවි බල ශක්ති කුටි 59 ක්, කොන්ක්‍රීට් කියුබ් 634 ක් හා පෙරසවි වැසිකිලි 346 ක් සැපයීම් සිදු කර නොතිබුණි.

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%)ලෙස තත්‍ය නිමවුම		
	100%-90%	75%-89%	50%-74%
ඉදිකල විදුලි වැට දිග (කි.මී.)	-	-	√
නඩත්තුකල විදුලි වැට දිග (කි.මී.)	-	-	√
අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන් (සංඛ්‍යාව)	-	√	-
වාසස්ථාන සුපෝෂණය කල බිම් ප්‍රමාණය (හෙක්ටාර්)	-	√	-
ස්ථාපිත කරන ලද මායිම් කණු (සංඛ්‍යාව)	-	-	√
ස්ථාපිත කරන ලද දැන්වීම් පුවරු (සංඛ්‍යාව)	-	√	-
ඉදිකරන ලද නව ගොඩනැගිලි (සංඛ්‍යාව)	√	-	-
අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි (සංඛ්‍යාව)	√	-	-
අළුත්වැඩියා කරන ලද මාර්ගවල දුර (කි.මී.)	-	-	√
අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම් (සංඛ්‍යාව)	-	√	-
අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා (සංඛ්‍යාව)	√	-	-
වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් (සංඛ්‍යාව)	-	-	√
වැඩි දියුණු කරන ලද ජල සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	-	-	√
වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	-	-	√
ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම (සංඛ්‍යාව)	-	-	√
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (සංඛ්‍යාව)	-	-	√
ක්‍රියාත්මක කල ජනවිභිදුම්කරණ වැඩසටහන් (සංඛ්‍යාව)	√	-	-
මිලදී ගන්නා ලද අලි වෙඩි (සංඛ්‍යාව)	√	-	-
නිෂ්පාදනය කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	√	-	-

සවි කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	√	-	-
කෙටි කාලීන පුහුණු වැඩසටහන් (සංඛ්‍යාව)	√	-	-
වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (සංඛ්‍යාව)	-	√	-
දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ (සංඛ්‍යාව)	-	-	√
විල්පත්තු ජාතික උද්‍යානයේ බලපෑම් කලාපය කලමනාකරණ ව්‍යාපෘතිය	√	-	-

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුනු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක (SDG)	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
14.සාගර මුහුදු හා සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය උදෙසා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතා කිරීම	**14.7** සමුද්‍ර ජීවීන් සංරක්ෂණය	• සමුද්‍ර සංරක්ෂණය උදෙසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු • අලුත්වැඩියා කරනලද බීජෂණ මධ්‍යස්ථාන	-	√	-
15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණ තිරසාර භාවිතය උදෙසා ප්‍රවර්ධනය, වනාන්තර තිරසාර ලෙස කලමනාකරණය,කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම, ජෛව විවිධත්වයට වන හානිය අවම කිරීම.	**15.1** ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම	• වනජීවී රක්ෂිත ප්‍රදේශවල ඉදිකරන ලද නව ගොඩනැගිලි සංඛ්‍යාව • මිලදි ගන්නා ලද යන්ත්‍ර හා කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව.	-	-	√
	15.1 ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුනු කිරීම්	• අලුත්වැඩියා කරන ලද ගොඩනැගිලි, කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව • වනජීවී රක්ෂිත ප්‍රදේශ මැණුම් කිරීම හා වෙන් කිරීම.	-	-	√
	15.1 වනජීවී සංරක්ෂණය උදෙසා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	• වනජීවී සංරක්ෂණය උදෙසා පුහුණු කරන ලද දේශීය වැඩ සටහන් සංඛ්‍යාව • බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	-	-	√
	15.1 රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය	• ජාතික උද්‍යානවල වැඩිදියුණු කරන ලද මාර්ග පද්ධතිවල දුර ප්‍රමාණය(කි.මී.). • සංවර්ධනය කරන ලද සනීපාරක්ෂක පහසුකම් සංඛ්‍යාව. • සංවර්ධනය කරන ලද ජල සැපයුම් පද්ධති හා සූර්යබල සැපයුම් පද්ධති සංඛ්‍යාව.	-	√	-

	15.1/15.9 15.c වනඅලි මිනිස් ගැටුම අවම කිරීම	• අළුතින් ඉදිකරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.) • නඩත්තු කරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.) • නඩත්තු කරන ලද විදුලි වැට ආරක්ෂක කුටි සංඛ්‍යාව. • මිලදී ගන්නාලද අලි වෙඩි ප්‍රමාණය • මිලදීගන්නා ලද විදුලි වැට උපකරණ සංඛ්‍යාව	-	√	-
	15.1/15.8 /15.9/15.c වනජීවී මිනිස් ගැටුම අවම කිරීම	• වැඩිදියුණු කරන ලද වනජීවී වාසස්ථාන සංඛ්‍යාව. • පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීම් හා අධ්‍යාපන වැඩ සටහන් සංඛ්‍යාව.	-	√	-
	15.4/15.8/15.9/ 15.c දේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය මාර්ග අවස්ථාවන් වැඩිකර ගැනීම	• රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව.	√	-	-
	15.5/15.6/15.7/ 15.c වනසත්ව හා වාක්ෂලතා ආඥා පනත හා වදවීමේ තර්ජනයට ලක්වී ඇති වනසතුන් හා පැලෑටිවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීම	• නිකුත් කරන ලද CITES හා FFPO බලපත්‍ර සංඛ්‍යාව	-	-	√
	15.5/15.c වනජීවී සංරක්ෂණය උදෙසා නූතන ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව	• පුහුණු කරන ලද දේශීය හා විදේශීය වැඩ සටහන් සංඛ්‍යාව	-	-	√

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14 හා 15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- **ජයග්‍රහණ**

i. රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් වනසත්ව මිනිස් ගැටුම් අවම කිරීමට හැකියාව ලැබීම.

ii. "කොවිඩ් 19" වසංගත රෝගය පැතිරී තිබෙන කාලසීමාවේදී පවා රක්ෂිත ප්‍රදේශතුල පරිසර පද්ධතින් සංරක්ෂණය කරන අතරම සංචාරක කර්මාන්තය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා වැඩි කිරීම හා එමගින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබීම.

iii. වනජීවීන්ගේ වාසස්ථාන සුපෝෂණ කටයුතු වැඩිකිරීම තුලින් වනඅලි මිනිස් ගැටුම අවම කිරීමට හැකියාව ලැබීම.

iv. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් මහජනතාව තුල සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහල නැංවීමට හැකිවීම.

v. CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව හා CITES RAMSAR වැනි අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම තුලින් ජාත්‍යන්තරය සමග කටයුතු කිරීම පහසුවීම.

- **අභියෝග**

i. "කොවිඩ් 19" වසංගත රෝගය පැතිරී පැවතීම නිසා වර්ෂය ආරම්භයේදී බලාපොරොත්තුවූ ඉලක්ක වෙත ලඟාවීමට නොහැකිවීම.

ii. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව ප්‍රජාව දැනුවත් නොවීම.

iii. නව හඳුන්වාදීම් එකවර ග්‍රහනය කරගැනීමට පවත්නා උනන්දුව අඩුවීම.

iv. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමට යාමේදී අවශ්‍ය සම්පත්වල හිඟකම.

v. රජය හා පෞද්ගලික අංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවික හා ජෛව සම්පත්වල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජන ඇතිවීම.

vi. විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්න්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම.

vii. ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු

viii. කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලඟාවීමට ඇති නොහැකියාව.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ (Senior Level)	84	52	32
තෘතීයික (Teritary Level)	18	5	13
ද්විතියික (Secondary Level)	1865	1123	742
ප්‍රාථමික (Primary Level)	897	746	151

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

පවතින රාජකාරි වපසරිය ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැත.

- කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හඳුනාගෙන ඉල්ලුම්කර ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සඵලදායීව සාක්ෂාත් කර ගැනීම සඳහා සේවක හිඟය බලපානු ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

පුහුණු වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව/ පිටපත් සංඛ්‍යාව	වැඩ සටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු 000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම (ලබා ගත් දැනුම)
			දේශීය	විදේශීය		
අලිමිනිස් ගැටුම් කළමනාකරණය සඳහා විදුලි වැට නඩත්තුව	1100 (පුහුනු වැඩ සටහන් 55)	දින 01	1182	-	දේශීය	විදුලි වැට නඩත්තුව හා අලි මිනිස් ගැටුම කළමනාකරණ කටයුතු සිදුකලයුතු ආකාරය පිළිබඳව නිලධාරින් පුහුණු කිරීම.
නවක බඳවාගත් සංවර්ධන නිලධාරින් සඳහා පුහුණුව	28 (පුහුණු වැඩ සටහන් 05)	දින 01	34	-	දේශීය	රාජ්‍ය සේවයේ රාජකාරි කටයුතු සිදුකිරීමේ ක්‍රමවේදය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සිදුකරන ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම.
සන්නිවේදන පද්ධති භාවිතය සහ නඩත්තු කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරින් පුහුණු කිරීම.	30 (පුහුණු වැඩ සටහන් 1)	දින 05	249	-	දේශීය	සන්නිවේදන පද්ධති භාවිතය සහ නඩත්තු කටයුතු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම.
ගිනිඅවි පරිහරණය පිළිබඳ පුහුණු වැඩ සටහන	50 (පුහුණු වැඩ සටහන් 1)	දින 10	462	-	දේශීය	ගිනිඅවි පරිහරණය සිදුකරන ආකාරය පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරින් පුහුණු කිරීම.
බංගලා භාරකරුවන් සඳහා පුහුණුව	34 (පුහුණු වැඩ සටහන් 02)	දින 03	413	-	දේශීය	ආහාර පිසීම,ආගන්තුක සත්කාර ක්‍රමවේද හා බංගලා නඩත්තුව.

දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා දෙමළ භාෂාව පුහුණුව	65 (පුහුණු වැඩ සටහන් 2)	දින 12	696	-	දේශීය	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම යටතේ දෙපාර්තමේන්තු නලධාරින් පුහුනු කිරීම.
උසාවි කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩ සටහන	30 (පුහුණු වැඩ සටහන් 1)	දින 06	416	-	දේශීය	උසාවි කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරින්ට පුහුණුව ලබාදීම.
වනසත්ව අඩවි ආරක්ෂක නිලධාරින් සඳහා වනජීවී කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව ලබාදීම	30	මාස 04	7,227	-	දේශීය	වනජීවී කළමනාකරණ කටයුතු පිළිබඳ පුහුනුව ලබාදීම.
කාර්යාලීය ලිපිගොනු පවත්වාගෙන යාම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රමවේදයන් සහ විදුලි කාර්මික ශිල්පීය ක්‍රම පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා පුහුණුව.	03 (පුහුණු වැඩ සටහන් 3)	දින 4 – 6 දක්වා	35	-	දේශීය	අදාල විෂය දැනුම ලබාදීම සඳහා
කොටි මිනිස් ගැටුම් කළමනාකරණය කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණුව	320 (පුහුණු වැඩ සටහන් 11)	දින 01	438	-	දේශීය	සත්ව මිනිස් ගැටුම් කළමනාකරණය සඳහා මහජනතාව දැනුවත් කළයුතු ආකාරය පිළිබඳ ලබාඇති දැනුම යාවත්කාලීන කිරීම.
පක්ෂීන්ට මුදු පැළැඳවීමේ වැඩසටහන	20 (පුහුණු වැඩ සටහන් 01)	දින 12	74	-	දේශීය	සත්ව විශේෂ සංරක්ෂණය සහ ඔවුන් අධ්‍යයනය පිළබඳව නිලධාරින් දැනුවත් කිරීම.
දෙපාර්තමේන්තු පර්යේෂණ	13 පර්යේෂණ	මාස 6-7 අතර	382	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරීන් රක්ෂිත කළාප කළමනාකරණ කටයුතු සඳහා අදාල පර්යේෂණ වල ප්‍රථිඵල යොදාගැනීම.
දෙපාර්තමේන්තුවෙන් පරිභාහිර පුද්ගලයින් සඳහා පර්යේෂණ කිරීමට අවසර ලබාදීම.	පර්යේෂණ 65	-	-	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරීන් රක්ෂිත කළාප කළමනාකරණ කටයුතු සඳහා අදාල පර්යේෂණවල ප්‍රථිඵල යොදාගැනීම.
ගුවන් විදුලි වැඩ සටහන් ප්‍රචාරය කිරීම.	වැඩ සටහන් 02	-	34	-	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීම.
සොබාධාරා රූපවාහිනී වැඩ සටහන ප්‍රචාරය කිරීම.	වැඩ සටහන් 17	-	8,500	-	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ.135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NDB) ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල නොවේ	අදාල අංශ විසින් පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම.	කඩිනමින් පිළිතුරු ලබාදෙන ලෙස සියළුම අංශ දැනුවත් කිරීම.
6	**අභ්‍යන්තර විගණනය**	අනුකූල වේ	-	-
6.1	මු.රෙ.134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	විගණන විමසුම යොමුකරන අංශය හෝ ආයතනය විසින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම.	කාර්යසාධන මිනුමක් ලෙස මෙම කරුණ ඇතුලත් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-

6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂයතුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම හා අපහරණයකිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිතවී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණයකර තිබීම.	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාල නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණයවූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	තොරතුරු කඩිනමින් ලබාගැනීමේ අපහසුතාවය	කඩිනමින් තොරතුරු ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කිරීම.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණයශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතුකර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිනුම් යාවත්කාලීනකර පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිනුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත්කල තත්කාර්ය	අනුකූල වේ	-	-

	අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.			
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාන්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මන්ඩල සිමාවතුළ කාර්ය මන්ඩලය පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මන්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	වනජීව් සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සෘජුවම සංචාරක බංගලා වෙන්කිරීම සම්බන්ධව පමණක් වුවද මෙයද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ	

			කරගතහැකි බැවින් පුරවැසි ප්‍රඥප්තියක් සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනැගේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැළැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-